# ඥානයෙහි සීමා සංකල්පය පිළිබඳ බෞද්ධ විග්‍රහයෙන් අනුභූතිවාදී ප්‍රවණතාවයක් ප්‍රකට වේද?

ආර්. පී. දිල්ශාන් මනෝජ් රාජපක්ෂ[1]

දාර්ශනික ඥානවිභාගය නම් අංශය තුළ සාකච්ඡා කෙරෙන ප්‍රධාන ප්‍රස්තුතයක් වනුයේ ඥානයේ සීමා ය.ඥානයට සීමා පැනවෙන්නේ යම්කිසි බාධාවක් නිසා ය. ප්‍රායෝගික සීමා, නෛසර්ගික සීමා, තාර්කික සීමා හා සදාචාරාත්මක සීමා යනාදිය අපගේ ඥානයට සීමා පනවන ප්‍රධාන සාධක ය. මෙහිදී ප්‍රායෝගික සීමා යටතේ භෞතික ලෝකය නැතහොත් ආනුභවික විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැන ගැනීමට ඇති නොහැකියාවන් අදහස් කෙරේ. නෛසර්ගික සීමා යටතේ අදහස් කෙරෙන්නේ ඥානය ලබා ගැනීම පිළිබඳ මානවයා තුළ පවත්නා සහජ කායික හෝ මානසික බාධාවන් ය. තාර්කික සීමා යටතේ අදහස් කරන්නේ භාෂාවේ පවත්නා බාධාවන් ඥානයේ සීමා සඳහා කොතෙක් දුරට බලපාන්නේද? යන්න පිළිබඳව යි. සදාචාරාත්මක සීමා ලෙස ගැනෙන සුවිශේෂී කරුණ තුළින් භාරතීයයන් ඥානයෙහි සීමා ආධ්‍යාත්මික පාරිශුද්ධිය සඳහා භාවිතා කළ අයුරු සාකච්ඡා කිරීමට උපකාරී වන බව පෙනේ.

බෞද්ධ දාර්ශනික සන්දර්භය අනුව බලන විට බුදුසමය ද ඥානයෙහි සීමා පිළිගෙන ඇති බවත්, එම පිළිගැනීම අනුභූතිවාදී ප්‍රවණතාවයකින් යුක්ත වන බවත් පෙනේ. තේවිජ්ජවච්ඡගොත්ත සූත්‍රයට අනුව බුදුරදුන් තමන් වහන්සේට ත්‍රිවිද්‍යා ඥානය පමණක් ඇති බව අවධාරණය කර තිබේ.

ඥානයෙහි පවත්නා, ප්‍රායෝගික සීමා පිළිබඳ බුදුසමය අවධානය යොමු කර තිබෙන බවට නිදසුන් රැසක් සූත්‍ර සාහිත්‍යයෙන් හමු වේ. සංයුත්තනිකායේ අව්‍යාකත සංයුත්තයේදී පෙන්වා දෙන්නේ පොළවේ වැලි, සයුරේ දිය මෙතැකැයි මනින්නට නොහැකි ය, යන්න යි.එයට හේතු නම් ඒවා අතිශය විශාල බැවිනි. එසේ ම සත්ත්ව විෂය ද පෘථුල ය. විෂය සීමාව නොපෙනෙන්නකි. බුද්ධ විෂය, ලෝක විෂය, කර්ම විෂය හා ධ්‍යාන විෂය යනුවෙන් සත්‍යෙක්ෂණයෙන් අවසන් කොට නිශ්චිත නිගමනයක් ලබා දිය නොහැකි විෂය කෙරේ අවධානය යොමු කර ඇත්තේ නෛසර්ගික වශයෙන් මානවයා සතු දුෂ්කරතා සැලකිල්ලට ගනිමිනි. ලෝක විෂයේ අසීමාන්තික බව සාකච්ඡා කළ බුදුරදුන් එහි දිග, පළල සෙවීමෙහි දුෂ්කරතාව අවධාරණය කර ඇත.

භාෂා සම්මතයන්හි සීමා ඉක්මවා යන්නේ නම් අවුල් පැන නැගිය හැකි බව පෙනවා දෙන්නේ ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර හෝ භාවිතවල එල්බ ගැනීමවත්, සම්මතය ඉක්මවා යාමවත්, යමෙකු විසින් නොකළ යුතු බව යි. ඥානයෙහි සීමාවෙන් ඔබ්බෙහි පවත්නා දේ පිළිබඳ බුදුසමය නිශ්චිත නිගමනයකට පැමිණීම අනුමත නොකරන අතර ම එලෙස ඒ පිළිබඳ දිගින් දිගට ම සිදුකරන නිශ්ඵල උත්සාහ ප්‍රතික්ෂේප කරයි. එය උපමාවකින් දක්වන්නේ නම් යමෙකුගේ උරයෙහි විදින ලද විෂ සහිත ඊතලයක් ඇනී ඇත්තේ ද එම ඊය වහා ගළවනු විනා එය විදි පුද්ගලයා පිළිබඳ තොරතුරු හා ඊය පිළිබඳ තොරතුරු විමසන්නට යාමෙන් මරණයට පත්වීමකට සමාන ය.

ප්‍රමුඛපද - ඥානයෙහි සීමා, බුදුදහම, ඥානවිභාගය, ප්‍රායෝගික සීමා, නෛසර්ගික සීමා, තාර්කික සීමා, සදාචාරාත්මක සීමා

1 සහාය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය, කොළඹ විශ්වවිද්‍යාලය
dilshanmanojrajapaksha@gmail.com